සාමාන්‍ය සමය විසිදෙවන ඉරුදින **දේව ප්‍රකාශන** 01-09-13

## පළමුවන කියැවීම

උපදේශකයා 3:17-18, 20, 28-29

උපදේශකයා හෙවත් සිරාක් පොතෙන් ගත් පාඨයෙකි.

**"බැගෑපත් වී සමිඳාණන්ගේ ප්‍රසාදය ලබා ගන්න."**

මාගේ පුත්‍රය, ඔබේ කටයුතු කිරීමෙහි දී කරුණාවන්ත ව සිටින්න. එවිට ඔබ ත්‍යාගිවන්ත මිනිසෙකුට වඩා ප්‍රේම කරනු ලබන්නෙහි ය. ඔබේ තත්ත්වය උසස් වන ප්‍රමාණයට ඔබ බැගෑපත් විය යුතු යි. එවිට සමිඳුන් ඉදිරියෙහි ඔබ ප්‍රසාදය ලබාගන්නෙහි ය. සමිඳුන්ගේ බලය මහත් ය. එහෙත්, උන් වහන්සේ යටහත් පහත් අයගේ ගෞරවය පිළිගන්න සේක. උඩඟු මිනිසාගේ දුර්භාග්‍යයට ප්‍රතිකාරයක් නැත්තේ ය. දුෂ්ටකම ඔහු තුළ මුල් ඇද තිබෙන හෙයිනි. නුවණැතියා තම සිත තුළ උපදේශයන් මෙනෙහි කරන්නේ ය. සවන් දෙන කණ ඥානවන්තයාගේ අපේක්ෂාව වන්නේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 68:3-6, 9-10

පිළිතුර: දෙවිඳාණෝ දිළිඳුන් රක්ෂා කරන සේක.

ගීය: එහෙත්, දැහැමියෝ දෙවිඳුන් අබිමුව ප්‍රීති ප්‍රමෝද වෙත් වා! ප්‍රීතියෙන් කුල්මත් වී ගී ගයත් වා! දෙවිඳුන්ට ගී ගයන්න; එතුමන්ගේ නම කියා එතුමන් පසසන්න. වලාකුළු අරා වඩින සමිඳුන් හට මාවතක් පිළියෙළ කරන්න.

එතුමන්ගේ නාමය සමිඳාණෝ ය, එතුමන් අබිමුව ප්‍රීතියෙන් සිටින්න. එතුමාණෝ, අනාථයන්ගේ පියාණෝ ද වැන්දඹුවන්ගේ ආරක්ෂකයාණෝ ද වන සේක. සිය ශුද්ධ නිවාසයෙහි වසන එතුමාණෝ දෙවිඳාණෝ ය.

දෙවිඳාණෝ අනාථ වූවන්ට නිවෙස් තනා දෙන සේක; හිරකරුවන්ට නිදහස දෙන සේක; එහෙත්, කැරලිකරුවන් මරුකතරේ විසීමට හරින සේක. අහෝ දෙවිඳුනි! ඔබ බහුල ව වැසි වස්වන සේක.

ඔබේ උරුමය මැලවී යන විට ඔබ එය යළි සාරවත් කළ සේක. ඔබේ සෙනඟ එහි පදිංචි වූ හ; අහෝ දෙවිඳුනි! එහි දිළිඳුන් හට උවමනා දේ ඔබ සපයා දුන් සේක.

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 12:18-19, 22-24

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**"ඔබ ළඟා වී සිටින්නේ සියොන් කන්දට ය; ජීවමාන දෙවියන් වහන්සේගේ නගරයට ය."**

ඔබ පැමිණ සිටින්නේ, ඉශ්‍රායෙල් ජනතාව මෙන් කළුවර, ඝන අන්ධකාරය, චණ්ඩ මාරුතය, හොරණෑ ශබ්දය, දේව හඬ යන මේවා සහිත ස්පර්ශ කළ හැකි, ගිනිගත් සීනයි කන්දට නොවේ. ඒ හඬ ඇසූ අය තවත් ඔවුන්ට එසේ කතා නොකරන ලෙස ඉල්ලා සිටියහ. එහෙත් ඔබ ළඟා වී සිටින්නේ සියොන් කන්දට ය; ජීවමාන දෙවියන් වහන්සේගේ නගරය වූ ස්වර්ගීය ජෙරුසලමට ය; කෝටි සංඛ්‍යාත දේව දූත සේනාවන්ගෙන් යුත් මහා රැස්වීමට ය; සගලොවෙහි නම් ලියා ඇති කුළුඳුල්

පුරවැසියන්ගේ සභාවට ය; සියල්ලන්ගේ විනිශ්චයකාර දෙවියන් වහන්සේ වෙතට ය; සම්පූර්ණ ලෙස ධර්මිෂ්ඨ කරන ලද අයගේ ආත්ම වෙතට ය; නව ගිවිසුමක මැදහත්කාරයාණන් වූ ජේසුස් වහන්සේ වෙතට ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ජුවාම් 14:23

ආලේලූයා! ආලේලූයා!
"යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය කරන්නෙමු"යි සමිඳාණන් වහන්සේ වදාරණ සේක.
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ලූක් 14:1, 7-14

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"තමා ම උසස් කරගන්න හැම දෙනා ම පහත් කරනු ලබති."**

සබත් දිනක ජේසුස් වහන්සේ නායක පරිසිවරයෙකුගේ ගෙදරට කෑම පිණිස වැඩිය සේක. හැම දෙන ම උන් වහන්සේ දෙස සෝදිසියෙන් බලා සිටියහ.
ආරාධනා ලත් අය ප්‍රධාන ආසන ලබාගන්නට සොයන බව දැක, උන් වහන්සේ ඔවුන්ට මේ උපමාව කියමින්, "යමෙකුගේ විවාහ මඟුලකට කැඳවීමක් ඔබට ලැබුණොත් ප්‍රධාන ආසනයේ හිඳ නොගන්න. යම් හෙයකින් ඔබට වඩා උසස් කෙනෙකු ද කැඳවනු ලැබුවොත්, ඔබ දෙදෙනා ම කැඳවූ තැනැත්තා අවුත්, 'ඔය ස්ථානය මොහුට දෙන්නැ'යි ඔබට කීවොත්, ලජ්ජාවෙන් යුක්ත ව පහත් ම ස්ථානයට යන්නට සිදු වේ. එහෙත්, ඔබ කැඳවනු ලැබූ කල ගොස් පහත් ම ස්ථානයෙහි හිඳගන්න; එවිට ඔබ කැඳවූ තැනැත්තේ අවුත්, 'මිත්‍රය, ඉහළ තැනකට එන්නැ'යි ඔබට කීවොත් ඔබ සමඟ කෑමට හිඳින සියල්ලන් ඉදිරියෙහි ඔබ ගෞරව ලබන්නෙහි ය. තමා ම උසස් කරගන්න හැම දෙනා ම පහත් කරනු ලබති; තමා ම පහත් කරගන්නා උසස් කරනු ලැබේ ය"යි වදාළ සේක.
උන් වහන්සේ තමන්ට ආරාධනා කළ තැනැත්තාට කතා කොට, "ඔබ රෑ කෑමක් හෝ දවල් කෑමක් හෝ පිළියෙළ කරන කල, ඔබේ මිතුරන්, සහෝදරයන්, නෑයන් හෝ පොහොසත් අසල්වාසීන් හෝ නොකැඳවන්න; එසේ කළොත් ඔවුන් ද එසේ ම ඔබත් කැඳවනු ඇත. එයින් ඔබට එහි විපාකය ලැබෙයි. එහෙත් ඔබ භෝජන සංග්‍රහයක් පිළියෙළ කරන කල, දිළිඳුන් ද අබ්බගාතයන් ද කොරුන් ද අන්ධයන් ද කැඳවන්න. ඔබට ප්‍රතිවිපාකයක් දෙන්නට ඔවුන්ට නොහැකි බැවින් ඔබ භාග්‍යවන්ත වන්නෙහි ය. ධර්මිෂ්ඨයන්ගේ පුනරුජ්ජීවනයේ දී ඔබට ප්‍රතිවිපාකයක් ලැබෙන්නේ ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.